රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය
அரசாங்க நிருவாகச் சுற்றறிக்கை
Public Administration Circular

අංක
இல.
No.
66 ✓

# විශ්‍රාම ගත් රාජ්‍ය නිලධාරීන් යළි සේවයේ යෙදවීම

## ஓய்வுபெற்ற அரசாங்க உத்தியோகத்தர்களை மீளப் பணிக்கமர்த்தல்

## Re-employment of Retired Public Officers

ආයතන මාලා අංක
தாபனத் தொடர் இல.
Establishments Series No.
49

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි

මිල/விலை/Price : -/10 තැපැල් ගාස්තුව/தபாற் செலவு/Postage : -/15

Cir. no - 66

මගේ අංකය: 2/3/9 (එච්) III (වෙළුම II).
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7, 1973 මාර්තු මස 26 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතටයි

**විශ්‍රාම ගත් රාජ්‍ය නිලධාරීන් යලි සේවයේ යෙදවීම**

රජය විසින් තීරණය කර ඇති අන්දමට මින්මතු:

(i) පූර්වකාලීනව විශ්‍රාම ගැනීම සඳහා තමාට ලැබෙන කිසියම් අභිමතයක් යටතේ වයස අවුරුදු 55 ට එළැඹීමට පෙරාතුව විශ්‍රාම ගන්නා කිසිදු නිලධාරියකු ඔහු විශ්‍රාම ගත් තනතුරෙහි, ශ්‍රේණියෙහි හෝ සේවයෙහි නැවතත් සේවය සඳහා නොයෙදවිය යුතුය.

(ii) එයාකාරයෙන් විශ්‍රාම ගන්නා නිලධාරියෙකු, අමාත්‍ය මණ්ඩලයේ නිශ්චිත අනුමතිය රහිතව, රාජ්‍ය සේවයෙහි හෝ යම්කිසි ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ (මහ බැංකුව, ජනසතු කර ඇති වාණිජ බැංකු, විශ්ව විද්‍යාල ආදිය ඇතුළුව) වෙනත් කිසිම තනතුරක, ශ්‍රේණියක හෝ සේවයක නැවතත් සේවය සඳහා නොයෙදවිය යුතුය.

2. ඔබේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ සහ ඔබේ අමාත්‍යාංශය යටතේ ඇති සියළුම රාජ්‍ය සංස්ථාවල නියුක්ත සියළුම නිලධාරීන්ගේ අවධානයට මෙම චක්‍ර ලේඛයේ අඩංගු කරුණු යොමු කරවනු මැනවි.

බී. මහාදේව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

ජක් 22729—10,010 (73/6)